සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / *All Rights Reserved*

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department Of Education – Western Province**

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් මේල් மாகாணக் கல்வித் திணைக்களம் மேல் மாகாணக் கல்வித் Department Of Education – Western Province Department Of Education – Western Province

**දෙවන වාර ඇගයීම**
**இரண்டாம் தவணை மதிப்பீடு - 2018**
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 02 යි. |

නම :-...................... ..........................................

විභාග අංකය :- ..............................

නිවැරදි බවට සහතික කරමි.

..................................
ශාලා නිරීක්ෂකගේ අත්සන

**වැදගත් :**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු **8** කින් සමන්විතය.
- **මෙම පිටුවේත්, තුන්වැනි පිටුවේත්** නියමිත ස්ථානවල ඔබේ **විභාග අංකය** නිවැරදිව ලියන්න.
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** දක්වන්න.
- පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

  **A කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින්.

  **B කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්.
- කටු වැඩ සඳහා හිස් කඩදාසි ලබාගත හැකිය.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| **A** | **1 – 25** | |
| **B** | **1** | |
| | **2** | |
| | **3** | |
| | **4** | |
| | **5** | |
| එකතුව | | |

| | |
|---|---|
| ........................ පළමු පරීක්ෂක | ........................ සංකේත අංකය |
| ........................ දෙවන පරීක්ෂක | ........................ සංකේත අංකය |
| ........................ ගණිත පරීක්ෂක | ........................ සංකේත අංකය |
| ........................ ප්‍රධාන පරීක්ෂක | ........................ සංකේත අංකය |

A කොටස

**ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

01. $\sqrt{7}$ ට වඩාත්ම ආසන්න අගය තෝරා යටින් ඉරක් අඳින්න.

**(i)** 2.5 **(ii)** 2.6 **(iii)** 2.7 **(iv)** 2.4

**02.** පැයට කිලෝමීටර 72 ක ඒකාකාර වේගයෙන් ගමන් කරන දුම්රියක් මිනිත්තු 15 කදී ගමන් කරන දුර කිලෝමීටර කීයද?

**03.** දර්ශක ආකාරයෙන් දක්වන්න. $\log_2 32 = 5$

**04.** සුළු කරන්න. $\frac{3}{4y} - \frac{1}{2y}$

**05.** රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




**06.** වාර්ෂික සුළු පොළියට රු. 2 500 ක් ණයට ගත් අයෙක් වර්ෂයක් අවසානයේ රු. 250 ක් පොළිය ලෙස ගෙවයි නම් වාර්ෂික සුළු පොළී අනුපාතිකය සොයන්න.

**07.** $a^2$ , 2ab යන වීජීය ප්‍රකාශන දෙකෙහි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

**08.** රු 975 න් $\frac{2}{3}$ ක් කීයද?

**09.** O කේන්ද්‍රය වූ වෘත්තයේ දී ඇති තොරතුරු ඇසුරෙන් $x$ හි අගය සොයන්න.




**10.** දී ඇති රූපයේ අඳුරු කර ඇති පෙදෙස කුලක අංකනයෙන් දක්වන්න.




**11.** සාධක සොයන්න. $x^2 + 9x + 8$

**12.** මල්ලක දොඩම් රසැති ටොෆී 5 ක් ද අඹ රසැති ටොෆී 4 ක් ද තිබේ. මල්ල තුළ නොබලා අහඹු ලෙස ටොෆියක් ඉවතට ගැනීමේ දී අඹ රසැති ටොෆියක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

**13.** දී ඇති තොරතුරු ඇසුරින් TU හි දිග සොයන්න.



**14.** විසඳන්න. $(a + 3)(a - 2) = 0$

**15.** දී ඇති තොරතුරු අනුව PQRS සමාන්තරාස්‍රයේ $x$ හි හා $y$ හි අගයන් සොයන්න.




**16.** නිවාස යෝජනා ක්‍රමයකට ජලය සපයන ජල ටැංකියක පරිමාව 3 600 $l$ කි. තත්පරයට ලීටර 18 ක ඒකාකාර සීඝ්‍රතාවයකින් ටැංකියෙන් ජලය බෙදාහරිනු ලබයි නම් ටැංකිය හිස් වීමට ගතවන කාලය තත්පර කීයද?

**17.** රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




**18.** පන්තියක සිටින සිසුන් 40 ක ගෙන් වඩාත් කැමති ක්‍රීඩාව පිළිබඳ විමසා ලබාගත් තොරතුරු අනුව අඳින ලද අසම්පූර්ණ වට ප්‍රස්තාරයක් රූපයේ දැක්වේ. ඒ අනුව ක්‍රිකට් ක්‍රීඩාවට කැමති සිසුන් ගණන සොයන්න.




**19.** $x + 2y = 8$ හි $x = 2$ නම් $y$ හි අගය සොයන්න.

**20.** රූපයේ දැක්වෙන XYZ සහ LMN ත්‍රිකෝණ අංගසම වේ. අංගසම අවස්ථාව ලියා $N\hat{L}M$ හි අගය ලියන්න.



**21.** දී ඇති සරල රේඛාවේ අනුක්‍රමණය සොයන්න.




**22.** දී ඇති දත්ත ඇසුරින් ABCD සමාන්තරාස්‍රයේ පරිමිතිය සොයන්න.




**23.** AB සහ BC රේඛාවට සමදුරින්ද, B සහ C ලක්ෂ්‍ය වලට සමදුරින්ද P ලක්ෂ්‍යයක පිහිටීම ලබාගැනීමට ශිෂ්‍යයෙකු විසින් අඳින ලද අසම්පූර්ණ දළ රූපයක් මෙහි දැක්වේ. P ලක්ෂ්‍යයේ පිහිටීම ලකුණු කිරීමට අවශ්‍ය නිර්මාණ රේඛාවල දළ සටහන් ඇඳ P ලකුණු කරන්න.




**24.** මෙම රූපයේ AC = AD = 8 cm වේ.
දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




**25.** විසඳන්න. $\frac{3}{2x} = 5$

B කොටස

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

**01.** මිනිසෙක් අඹ තොගයක් එකක් රුපියල් 30 බැගින් මිලට ගත්තේය. ඉන් $\frac{1}{5}$ ක් නරක් වී තිබිණි.

**(i)** නරක් නොවී තිබුණු අඹ ප්‍රමාණය මුළු අඹ වලින් කුමන භාගයක්ද?

**(ii)** නරක් නොවුනු අඹ වලින් $\frac{1}{4}$ ක් තම පරිභෝජනයට තබා ගත්තේ නම් පරිභෝජනයට ගත් අඹ ප්‍රමාණය මුළු අඹ වලින් කුමන භාගයක්ද?

**(iii)** විකුණූ අඹ ගෙඩි ගණන 60 ක් නම් ඔහු මිලට ගත් මුළු අඹ ගෙඩි ගණන කීයද?

**(iv)** විකුණූ අඹ යොදා ජෑම් නිෂ්පාදනය කරනු ලැබුවහොත් ජෑම් බෝතලයක නිෂ්පාදන වියදම රු 250 ක් වේ. ජෑම් බෝතලයක් සඳහා 15% ක අගය මත එකතුකල බද්දක් (VAT) අයකරයි නම් ජෑම් බෝතලක විකුණුම් මිල කොපමණද?

**02.** පළතුරු වවා ඇති ගෙවත්තක එක් එක් පළතුරු වගාව සඳහා බිම් ප්‍රමාණ වෙන්කර ඇති ආකාරය පහත වට ප්‍රස්තාරයෙන් දැක්වේ.




**(i)** අඩුවෙන්ම වගා කර ඇති පළතුරු වර්ගය කුමක්ද?

**(ii)** අඹ හා කෙසෙල් වගාකර ඇති බිම් ප්‍රමාණ අතර අනුපාතය සොයන්න.

**(iii)** කෙසෙල් වගාකර ඇති කොටස ගෙවත්තේ මුළු බිම් ප්‍රමාණයෙන් කුමන භාගයක්ද?

**(iv)** ගෙවත්තේ මිදි වගාකර ඇත්තේ $60\ m^2$ බිම් ප්‍රමාණක නම් ගෙවත්තේ මුළු වර්ගඵලය සොයන්න.

**(v)** අන්නාසි වගාකළ බිම් ප්‍රමාණය කොපමණද?

**03. (a)** දිනකට පැය 6 බැගින් වැඩ කරන මිනිසුන් 3 දෙනෙකුට තාප්පයක් බැඳ නිම කිරීමට දින 2 ක් ගත වේ.

**(i)** තාප්පය බැඳ නිම කිරීමට අවශ්‍ය මිනිස් පැය ප්‍රමාණය කොපමණද?

**(ii)** දිනකට පැය 9 බැගින් වැඩ කරන මිනිසුන් දෙදෙනෙකුට එම කාර්යය නිම කිරීමට ගතවන දින ගණන කීයද?

(b) වාහනයක් ආනයනය කිරීමේදී එහි වටිනාකමින් 15% ක් තීරු බදු වශයෙන් ගෙවිය යුතුය. වාහනයේ ආනයනික වටිනාකම රු 750 000 ක් වේ.

**(i)** තීරු බදු ගෙවීමෙන් පසු වාහනයේ වටිනාකම කොපමණද?

**(ii)** මෙම වාහනය විකිණීමේදී 12% ක ලාභයක් ලැබෙන සේ විකිණිය යුතු මිල සොයන්න.

**04.** දැල්පන්දු කණ්ඩායමක එක සමාන හැකියාවෙන් යුත් ක්‍රීඩිකාවන් 7 ක් සිටිති. ඉන් හතරක් හිස් වැසුම් පැළඳ සිටින අතර, රතු පාට පටි බැඳගත් දෙදෙනෙක් ද කළු පාට මේස් පැළඳි එක් අයෙක් ද සිටිති. හිස්වැසුම් පැළඳි අය $A_1$ , $A_2$ , $A_3$ හා $A_4$ ලෙස ද රතු පාට පටි පැළඳි අය $B_1$ හා $B_2$ ලෙස ද කළු පාට මේස් පැළඳි අය $C_1$ ලෙස ද ගෙන,

**(i)** කණ්ඩායමේ සියළු ක්‍රීඩිකාවන් ඇතුලත් නියැදි අවකාශය(S) ලියන්න.

එම ක්‍රීඩිකාවන් අතරින්,

**(ii)** හිස් වැසුමක් පැළඳි අයෙක් වීමේ සම්භාවිතාව සොයන්න.

**(iii)** කළු මේස් පැළඳි අයෙක් වීමේ සම්භාවිතාව සොයන්න.

**(iv)** රතු පාට පටි බැඳගත් අයෙක් හෝ කළු මේස් පැළඳි අයෙක් වීමේ සම්භාවිතාව සොයන්න.

**(v)** හිස්වැසුමක් නොපැළඳි නමුත් රතුපාට පටියක් බැඳගත් අයෙක් වීමේ සම්භාවිතාව කීයද?

**05.** ABCD සෘජුකෝණාස්‍රාකාර ලෝහ ආස්තරයකින් රූපයේ දැක්වෙන පරිදි AED කේන්ද්‍රික ඛණ්ඩයක් කපා ඉවත් කර ඇත.




**(i)** කේන්ද්‍රික ඛණ්ඩයේ අරය කීයද?

**(ii)** ABCDE ලෝහ ආස්තරයේ පරිමිතිය සොයන්න.

**(iii)** ABCDE ලෝහ ආස්තරයේ වර්ගඵලය සොයන්න.

**(iv)** ADE කේන්ද්‍රික ඛණ්ඩය කපා ඉවත් නොකර ADE කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලයට සමාන වන සේ ද AB රේඛාව මත F පිහිටන සේද ADF සෘජුකෝණී ත්‍රිකෝණයක් කපා ඉවත් කළේ නම්, එවිට ලැබෙන ආස්තරය ඉහත රූපයේම ඇඳ එම හැඩය හඳුන්වන විශේෂ නාමය ලියා දක්වන්න.

**(v)** AF දිග සොයන්න.